දෙපාර්තමේන්තු චක්‍රලේඛ 24/2015

බ/13/සත්ත්ව තොග/2015,
අත්තිකාරම් ගිණුම් අංශය,
2015/09/28.

බන්ධනාගාර අධිකාරි,
සහකාර බන්ධනාගාර අධිකාරි,

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සත්ත්ව තොග ගිණුම්ගත කිරීම.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සත්ත්ව තොග පාලනය පවත්වා ගෙන යන බොහෝමයක් බන්ධනාගාර ආයතන විසින් දෙපාර්මේන්තු නිත්‍ය නියෝග අංක 914 ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳව හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳව විගණකාධිපතිගේ විගණන විමසුම්වලින් අවධාරණය කර ඇත.

දැනට සිටින සතුන් තොග ලෙස සැලකීමත් වෙළඳ හා ලාභ අලාභ ගිණුමට සත්ත්ව තොග ගැලපීමේදී සත්ව තොග අගය වැඩිවීම නිසා විකුණුම් පිරිවැය සෘණ අගයක් ගැනීමත් උපලබ්ධි නොවූ ලාභයක් ගිණුම් තුලින් පෙන්වීමත් නිසා මූල්‍ය ප්‍රකාශන වලින් නියම තත්වය නිරූපණය නොවේ.

තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යටතේ ඡේද අංක 76 හි ජංගම වත්කම් යන්න පැහැදිලි කර ඇති කරුණු වලට අයත් නොවන සියළුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළයුතු බව දන්වා ඇත.

එම නිසා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්ව තොග වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීම සඳහා ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට සංචිත ගිණුමක් හා සත්ව තොග ස්ථාවර වත්කම් ගිණුමක් ලෙස පවත්වා ගත යුතුයි. මේ අනුව 2015 වර්ෂයේ වෙළඳ හා ලාභ අලාභ ගිණුමේ සත්ව තොග දැක්වීම සිදු නොවන අතර ශේෂ පත්‍රයේද ජංගම වත්කම් ලෙස පෙන්නුම් කරනු නොලැබේ. මේ සඳහා සත්ව තොග සංචිත ගිණුම හා ස්ථාවර වත්කම් යටතේ සත්ව ගිණුමක් පවත්වා ගනු ලැබේ. එම නිසා සතුන් පිළිබඳ සියළු තොරතුරු විස්තරාත්මක වශයෙන් මූලස්ථානය වෙත වාර්තා කල යුතුයි. (ඇමුණුම් අංක 01 පරිදි) ඒ අනුව ඉදිරියේදී වෙළඳ හා ලාභ අලාභ ගිණුමේ සත්ව නිෂ්පාදන සඳහා දරනු ලබන ආදායම් හා වියදම් පමණක් ඇතුලත් කරනු ලැබේ. සතුන් විකිණීම හෝ ඉවත් කිරීම සත්ව අපහරණ ගිණුමක් මගින් ගැලපීම් කර ලාභය/අලාභය පමණක් වෙළඳ හා ලාභ අලාභ ගිණුමට ඇතුලත් කරනු ලැබිය යුතුයි. ඉහත තත්වය අනුව ගිණුම් කටයුතු සඳහා ඇමුණුම් අංක 01 ට අනුව සතුන් පිළිබඳ සකස් කරනු ලබන වාර්තාව 2015/10/15 දින හෝ ඊට පෙර මූලස්ථානයේ අත්තිකාරම් ගිණුම් අංශයට ලබාදෙන ලෙසට දැනුම් දෙමි.

එම්.බී.ආර්.පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත - බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)

ස්ථාවර වත්කම් යටතේ වූ සත්ව තොග සංචිත ගිණුම　　　　　ඇමුණුම් අංක-1

| සතුන් වර්ගය | සතුන්ට ලබාදී ඇති අංක | 2015/01/01 ට වටිනාකම | | වර්ෂය තුල මිලට ගැනීම් | | ජීවබර වැඩිවීම | | පරිත්‍යාග ලැබීම් | | සතුන් විකිණීම් | | ජීවබර අඩුවීම් | | සත්ව තොග කපාහැරීම් | | පරිත්‍යාග කර නිදහස් කිරීම් | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනාකම | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

*2015/01/01 ට සත්ත්ව වටිනාකම සඳහන් කිරීමේදී එය 2014/12/31 සත්ත්ව තොග වටිනාකමට සමාන විය යුතුයි.

*මෙය ත්‍රෛමාසික වාර්තාවක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුයි.

*ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

සකස් කලේ :-　　　　　පරීක්ෂා කලේ :-